**#mediaethicsSL #EnglishPress #SinhalaPress #lka #Divaina #Mawbima #BBCNews #June07**

සිය දිවි හානිකරගැනීමේ පුවත් ඉදිරිපත් කිරීමේදී තිරව පිළිපැදිය යුතු මාධ්‍ය ආචාර ධර්මයන් සහ එහිදී වඩාත් යෝග්‍ය වන මාධ්‍ය භාවිතයන් පිළිබඳ සම්මුතියක් ලෝකයේ පවතින්නේ, එවැනි පුවතක් වාර්තා කිරීමේ ආකාරය හරහාද දිවි තොර කර ගැනීම් සඳහා වක්‍රාකාරව ලැබෙනා අනුබලයක් ඇති නිසාවෙනි. මන්දයත් සිය දිවි හානි කරගැනීම් අප විසින් යළි යළිත් පෙන්වා දී ඇති ආකාරයට සමාජ ගැටළුවක් දක්වා වර්ධනය වී ඇති නිසාවෙනි.

මව්බිම පුවත්පතේ මෙවැනි ප්‍රවෘත්තියක් පළමු පිටුවේම දක්වා තිබුණත්, එම පුවත සමගින් උපකාරක සේවා අංකයන් සඳහන් කර තිබෙනු දක්නට නැත. මෙවැනි පුවතක් මුල් පිටුවේම පළ කොට ඊට ඉහළ අවධානයක් ලබාදීම යෝග්‍ය වන්නේද? එසේම දිවයින පුවත්පතේ පළ කොට ඇති කේට් ස්පේඩ්ගේ මරණය පිළිබඳ ප්‍රවෘත්තියේද උපකාරක සේවා අංකයන් සඳහන් කර තිබෙනු දක්නට නොමැති අතර, එම ලිපිය තුළ ඇය සිය දිවි හානි කරගත් ආකාරය නැවත නැවතත් දක්වා තිබෙනු නිරීක්ෂණය කළ හැක.
මෙම ප්‍රවෘත්තියම බීබීසීය මගින් පළ කොට ඇති ආකාරයද විමසා බැලීම වටී. පළමුකොටම එහි සිරස්තලයේම සියදිවි හානිකරගත් බව සඳහන් නොවේ. එසේම ලිපිය අවසානයේදී උපකාරක සේවා අංකයන් පළ කිරීමටද ඔවුන් සැලකිලිමත් වී ඇත.

හදිසි උපකාරක සේවා අංකය: 1333